සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සමාජ විද්‍යා අංශය

# 10 ශ්‍රේණිය ඉතිහාසය

# 10 . ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය - ඒකක ඇගයීම

වයි.ආර්.එරංගා ගයානී රූපසිංහ (ශ්‍රී .ලං.ගු.සේවය)

කෑ/දෙහි/ඉංගිරියාවත්ත මහා විද්‍යාලය - දෙහිඕවිට අධ්‍යාපන කලාපය

පහත සඳහන් ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න .

1 වන කොටස

01.අතීතයේ සිට යුරෝපය හා ආසියාව අතර වෙළඳ සම්බන්ධතා පැවැත්වූ ප්‍රධාන මාර්ග 3 ක් නම් කරන්න

02.දේශගවේෂණය දියුණුවීමේ ප්‍රතිඵලයක් ලෙස, පෙරදිගට පැමිණි යුරෝපා ජාතීන් සඳහන් කරන්න

03.පෘතුගාලයේ ආරම්භ වූ නාවික විද්‍යාලය කුමක් ද?

04.වස්කොද ගාමා කැලිකට් වරායට පැමිණීමෙන් පසු කළ ප්‍රකාශය කුමක් ද?

05.පෘතුගාලයේ පාලකයා විසින් පෙරදිග ප්‍රතිරාජයා වශයෙන් පත් කර සිටි පුද්ගලයාගේ නම සඳහන් කරන්න

06.පෘතුගීසි ජාතිකයන්ට ලංකාවට පැමිණීම වැදගත් වූයේ කුමක් නිසාද?

07.හයවන විජයබාහු රජු මරණයට පත් කළ පුද්ගලයා කවුරුන්ද?

08.පෘතුගීසි ශ්‍රී ලංකාවට පැමිණෙන විට කෝට්ටේ රාජ්‍යයේ පාලකයාව සිටි රජු සඳහන් කරන්න

09.පළමුවන රාජසිංහ නමින් රජවූයේ කවුරුන් ද?

10.පෘතුගීසි පෙරදිග වෙළඳ සමාගම හැඳින්වූ නම සඳහන් කරන්න.

11.දන්තුරේ සටනේ අවසාන ප්‍රතිඵල 2 ක් සඳහන් කරන්න

12.1638 පෘතුගීසින් පළවා හැරීම සඳහා ගිවිසුම අත්සන් කළ ශ්‍රී ලාංකික රජු හා ලන්දේසි ජාතිකයා නම් කරන්න.

13.උඩරට රජු හා ලන්දේසින් අතර හොඳ හිත පළුදු වූයේ ඇයි?.

14.උපරිම වාසි ලබා ගැනීම සඳහා ලන්දේසි අනුගමනය කළ ප්‍රතිපත්ති මොනවාද?.

15.ලන්දේසින් සාම ගිවිසුමක් 1766 දී අත්සන් කළේ කිනම් රජු සමගද?

16.විදෙස් වලින් උපසම්පදා භික්ෂූන් වහන්සේලා ගෙන්වීමට ලන්දේසින්ගෙන් නාවික සහය ලබාගත් රජවරු නම් කරන්න

පහත සඳහන් ප්‍රශ්න වලට වගුව තුළ පිළිතුරු සපයන්න

| | සටනේ නම | වර්ෂය | මුහුණ දුන් උඩරට රජු | සටන මෙහෙයවූ පෘතුගීසි සෙන්පති | සටන ක්‍රියාත්මක වූ ප්‍රදේශය | සටනේ ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|
| 17 | දන්තුරේ | | | | | |
| 18 | බලන | | | | | |
| 19 | රන්දෙණිවල | | | | | |
| 20 | ගන්නොරුව | | | | | |

11 කොටස

01.1.පහත සඳහන් ස්ථාන ලෝක සිතියමක ලකුණු කරන්න

පෘතුගාලය,මහා බ්‍රිතාන්‍ය,ප්‍රංශය ,රතු මුහුද,පර්සියන් බොක්ක, මධ්‍ය ධරණී මුහුද,

කොන්ස්තන්තිනෝපලය ,බතාවිය,කැලිකට්,ඕලන්දය.

2.පහත ස්ථාන ලංකා සිතියමක ලකුණු කරන්න.

කෝට්ටේ,කැළණිගඟ,මහනුවර,ගාල්ල,ත්‍රිකුණාමලය,යාපනය,මන්නාරම,සීතාවක,රන්දෙණිවල,බලන

3.



1.මෙම පින්තූරය කුමක්ද?

2.මෙම පින්තූරයේ සිටින්නේ කුමන විදේශික කණ්ඩායමක්ද?

3.ඔවුන්ගේ මව් රට සඳහන් කරන්න

4.කිනම් රාජධානි යුගයකට අයත්ද?

02.1.ශ්‍රී ලංකාවට පැමිණි යුරෝපා ජාතික කණ්ඩායම් 3 නම් කරන්න

2.ඉන්දියාවේ කැලිකට් වලට හා ලංකාවට මුලින්ම පැමිණි පෘතුගීසි කණ්ඩායමේ නායකයින් නම් කරන්න.

3.පෘතුගීසින් පැමිණෙන විට ලංකාවේ රාජධානි සඳහන් කර ඉන් දෙකක් විස්තර කරන්න

4.වර්ෂ 1505 සිට 1658 දක්වා පෘතුගීසින් ශ්‍රීලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ නමුත් උඩරට රාජ්‍ය අත්පත් කර ගැනීමට ඔවුන්ට නොහැකි විය . හේතු දෙකක් ඇසුරින් විසතර කරන්න

03. 1.ලන්දේසි පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය නම් කරන්න

2.උඩරට රජු හමුවීමට පැමිණි ලංදේසි දූතයින් දෙදෙනෙකු නම් කර ,ඔවුන් හමු වූ උඩ රට රජවරු සඳහන් කරන්න .

3.ලන්දේසීන් වර්ෂ 1638 හා වර්ෂ 1766 අත්සන් කළ ගිවිසුම් දෙකෙන් ලන්දේසින් වාසි ලබා ගැනීමට ක්‍රියාකළ ආකාරය කෙටියෙන් විසුතර කරන්න

4.ලන්දේසීන් උඩරට රාජ්‍ය සමඟ සම්බන්ධතා පවත්වමින් වාසි ලබා ගැනීමට උත්සහ කළ ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න